


# නිර්මාණ බාරගන්නා අවසාන දිනය 2006 පෙබරවාරි 28

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව අතර සිංහල සාහිත්‍යය පිළිබඳව ඇතිව තිබෙන පිබිදීම ආශ්වාදජනකය. මේ මොහොතේ දී මෙරට සිට සිංහලෙන් ලියන ලේඛක ලේඛිකාවන් දිරිමත් කිරීම සිය වගකීමක් ලෙස සන්නස සලකයි. සන්නස වාර්ෂික සාහිත්‍ය තරග මාලාව ඇරඹෙන්නේ ඒ සිතිවිල්ල නිසා ය.

තරග මාලාව කෙටිකතා සහ කාව්‍ය වශයෙන් දෙකොටසකින් යුක්ත වෙයි. සහභාගිවන විවිධ වයස් කාණ්ඩ වලට අයත් ලේඛක ලේඛිකාවනට අසාධාරණයක් නොවන සේ විවෘත හා කණිෂ්ඨ වශයෙන් අංශ දෙකක් යටතේ තරග පැවැත්වෙයි.

**විවෘත අංශය**

වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට විවෘත අංශයට සහභාගි විය හැකි ය.

**කණිෂ්ඨ අංශය**

වයස අවුරුදු 18 ට අඩු තරගකරුවනට/තරග කාරියනට මේ අංශය වෙන් වෙයි.

**කෙටි කතා (විවෘත/කණිෂ්ඨ)**
**පොදු කොන්දේසි**

1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් හැකි ය.
4 කෙටිකතාව තමාගේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමග එවිය යුතුය.

**කාව්‍ය නිර්මාණ (විවෘත/කණිෂ්ඨ)**
**පොදු කොන්දේසි**

1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

**සියළුම අංශ සඳහා පොදු කොන්දේසි**

1 සෑම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය **2006 පෙබරවාරි 28** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න.

සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2006
**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia

## කතා බහ

ජගත් ජේ. එදිරිසිංහ

### ශුද්ධ සිංහල

කතා බහ ට කවදත් හිතවත් අනුර පනාගොඩ හිතවතා අපූරු කතාවක් ලියලා එවලා තිබුණා. මේක අනුරගේ යාලුවෙකුට වෙච්ච දෙයක්. යාලුවගේ නම සරත් කියලා අපි හිතමු.

සරත් වැඩ කරන්නෙ එක්තරා කර්මාන්තශාලාවක. දවසක් ඔහු ෆෝක්ලිෆ්ට් යන්ත්‍රයකින් යමක් ඔසවාගෙන පසුපසට යද්දි ළඟ හිටිය සුද්දෙකුගෙ කකුලේ යාන්තමට ගෑවුණා ලු. ගෑවුණා විතරයි සුද්දා මහා හයියෙන් කෑ ගහන්නත් සරත්ට බනින්නත් පටන් ගත්තලු. සරතුත් ෆෝක්ලිෆ්ට් එකෙන් බැහැලා ඇවිත් සුද්දට හොඳටම බනින්න පටන් ගත්තලු. නිකම් නෙවෙයි.. සුද්දගෙ සද්දේ පරදවන සද්දයකින්.

ටික වෙලාවක් බනින කොට සරත් දිහා තුෂ්නිම්භූත වෙලා වගේ බලා හිටිය සුද්දා හිනාවෙන්න පටන් ගත්තලු.

මොකද තමුසෙ හිනාවෙන්නෙ..? සරත් ඇහුවලු.

මං හිනාවෙන්නෙ උඹ කියන කිසිම දෙයක් මට තේරෙන්නෙ නැති නිසා.. කියලා සුද්දා කිව්වලු. එතකොට තමයි සරත්ට තේරුණේ තමන් මෙච්චර වෙලා බැනලා තියෙන්නෙ සිංහලෙන් කියලා. නිකම්ම සිංහල නෙවෙයි. ශුද්ධ සිංහල...

අදටත් යාලුවා කියනවා මචං සිංහල අමතක වුණත් ශුද්ධ සිංහල නම් අමතක වෙන්නෙ නෑ කියලා. සමහර වෙලාවට හිතෙනවා ඇවිදින් ටික කලක් යන විට සිංහල අමතක වෙන අපේ සමහර අයට ශුද්ධ සිංහලවත් අමතක නොවී තියෙනවා නම් කියලා...... අනුර ලිපිය ඉවර කරලා තිබුණේ එහෙම.

### ගම් රටවල් බලා යන කාලය ඇවිත්

මේ අපි ගම් රටවල් බලා යන කාලයයි. බොහෝ දෙනෙක් මේ වන විටත් ලංකාවට ගිහින්. මේ මාසෙ අන්තිම වන විට නැත්නම් ලබන මාසෙ මැද වන විට මේ හැමෝම වගේ ආපහු එනවා.

ආපහු ලංකාවෙන් ආවට පස්සෙ අපි ලංකාවෙ හිටිය කාලය තුළ අපි මොනවද කළේ කිව්වෙ කියලා ටිකක් මෙනෙහි කරන එක හොඳයි. අපේ රටේ දුප්පත් නෑයන්ට අහල පහල උදවියට අපේ ලොකුකම් පෙන්නන්න අපි කොයි තරම් මහන්සි වුණා ද කියලා හිතලා බලන්න. නැති ලොකු කම් මවා පා දන්න ආඳුනන අය ඉදිරියේ ලොකු මිනිසුන් හැටියට පෙනී හිටින්න අපේ කී දෙනෙක් මහන්සි වෙන්න ඇද්ද..

පහුගිය දවසක ලංකාවට ගිය අපේ හිතවතෙක් ගමේ කඩේට ගිහින් ඇහුවලු බාස්මතී හාල් තියෙනවද කියලා.

### සුද්දා වගේ වැඩ

අපේ ගේ ඉස්සරහ පාර අයිනෙ ලයිට් කනුවක් ළඟ සිකුරාදා උදේ පාන්දරක වයසක සුදු මහත්තයෙක් කඩදාසියක ඇඳපු මොකක්ද බෝඩ් එකක් හයි කරනවා මං බලාගෙන හිටියා. එයා ගියාට පස්සෙ මං දැක්කා ඒක සෙනසුරාදා ගරාජ් සේල් එකක් පිළිබඳ දැන්වීමක් කියලා.

ඊට පස්සෙ මට ඒක එහෙමම අමතක වුණා. ඉරිදා හවස අර මහත්තයා ආයෙම ලයිට් කණුව ළඟ ඉන්නවා මම දැක්කා. මේ පාර එල්ලන්න හදන්නෙ මොන දැන්වීමක්ද කියලා මම බැලුවා. නෑ.. එයා අලුතින් දැන්වීමක් එල්ලුවෙ නැහැ. අර කලින් දවසෙ එල්ලලා ගිය දැන්වීම ගැලෙව්වා.

අපේ වැඩේ කරගත්තට පස්සෙ අපේ අතින් ඉටුවිය යුතු යුතුකම් ගැන මේ වගේ හිතන අය කීයෙන් කී දෙනාද අපි අතර ඉන්නෙ.

### අඩුවක්

ගිය මාසෙ පාරෙන් අහුලන් ආ රේඩියෝ කාරයා කතාවෙ පොඩි අඩුවක් තිබුණා. ඒ අඩුව පුරවන්න නැතිව ඉන්න එක හිතට හරි නැහැ. භාතිය ව ගුවන් විදුලියට කැන්දාගෙන ගියේ සන්නස පත්තරේ සාලිය ගලප්පත්ති සොහොයුරා බව ලියලා තියන එක මගේ යුතුකමක්.

දෙපාරම පැරදුන පක්ෂ නායකයෙක්ගේ ඉරණම මොකක්ද කියන එක මෙතෙක් කලක් සාකච්ඡාවට භාජනය වුණේ නැහැ. ඒ ගැන විස්තර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවාද දන්නෙත් නැහැ.

කොහොම වුණත් රනිල්ටත් එදා ඉඳලම පක්ෂය ඇතුළේ විරුද්ධවාදීන් හිටියා. රනිල්ට කොන්දක් නැහැ කියලත් ඒ උදවිය කිව්වා. රනිල්ගේ 'කොන්ද නමින් මොවුන් හඳුන්වන්නේ බලය පාවිච්චි නොකිරීම ගැනයි. තවත් පැහැදිලිව කිව්වොත් ගහලා මරලා ගිනිතියලා හරි කමක් නැහැ බලය අල්ලන්න ඕනේ කියන එකයි. දෙවැනි පාරටත් රනිල් පරාද වුණ නිසා අවියට තියෙන ගිණි පුපුරු වගේ රනිල් විරෝධීන් නැවතත් රනිල්ට එරෙහිව අවි අමෝරා ගනිවි.

නමුත් ගෞරවන්විතව රනිල් පක්ෂ නායකකමින් ඉවත් වුණොත් එජාපයේ ඊළඟ නායකයා කවුද? රනිල් වැනි දේශපාලන අත්දැකීම් තිබෙන ජාත්‍යන්තර සබඳකම් ඇති තවත් නායකයෙක් එජාපයට සිටිනවාද? කෙටිම පිළිතුර 'නැත' යන්නයි. කරු ජයසූරිය එජාප නියෝජ්‍ය නායකතුමා දැහැමි පුද්ගලයෙක්. ඒත් ඔහුට එජාපය වැනි දැවැන්ත පක්ෂයක නායකත්වය දැරීම පහසු කටයුත්තක් නොවේ. එස්.බී. දිසානායක ගැන රටේ ජනතාවගේ විශාල පැහැදීමක් නැත. මිලින්ද මොරගොඩ, මලික් සමරවික්‍රම ලංකාවේ ජීවත් වුණත් ඒ උදවිය හිතන්නේ ජෝර්ජ් බුෂ්ගේ මොළෙන්. ඒක ලංකාවට ගැලපෙන්නේ නැහැ.

ඒ නිසා රනිල් වික්‍රමසිංහ හැර වෙනත් නායකයෙක් අද එජාපයට නැත. රනිලුත් ජෝජ් බුෂ්ගේ මොළෙන් හිතුවත් එතුමාගේ ඉතා හොඳ ලක්ෂණයක් තියෙනවා. ඒ තමයි මහත්මකම. මහත්මා දේශපාලනය. ඒ නිසා ඉදිරියටත් රනිල් වික්‍රමසිංහ එජාප දේශපාලන වේදිකාවේ නායකත්වය දරනු ඇතැයි අපගේ විශ්වාසය. ■




රජතුමා බිසව සමග මහ වැලි ගංතොට දිය නෑම පිණිස ගියා. රජතුමා වැලි තලාවක් මත හිඳ ගත්තාය. බිසවට විහිළුවක් කිරීමට අදහස් කළ රජතුමා අන්දරේ අමතා බිසවුන් වහන්සේ මට ඇති ආදරය පෙනෙනවා නොවේදැයි ඇසීය.

ඊට පිළිතුරු වශයෙන් අන්දරේ මෙසේ පැවසීය.

බොහොම හොඳයි රජකම් කළ වැඩක් — වගෙයි
දෙවතුමාට මහබඹු දුන් ලියක — වගෙයි
ලෝකේ ඉන්න පඬිනට පිස් සුවක් — වගෙයි
කොහොඹ ගහට කරවිල වැල ගියා — වගෙයි

අන්දරේගේ උපමාව ගැන රජතුමා උදහස් විය. ඒ බව තේරුම් ගත් අන්දරේ රජතුමා සැනසීම වස් මෙසේ කවියකින් පැවසීය.

කොහොඹ හොඳ දෙයකි වෙදවරු — ගනින්නා
කරවිල අම පලක් ලෙස ගෙන — උයන්නා
පඬිවරු පිස්සුවෙන් මෙන් නිති — බනින්නා
මාවද වරදකරු අසලම — සිටින්නා